**සුරාබදු තෑගි අරමුදල - 2016**

-----------------------------------

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනතේ 58 ඒ වගන්තිය යටතේ පලකළ 1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 1(iii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තැගි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි විධිවිධානවලට පටහැනිව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත පිළියෙල කර තිබුණි. එසේම රු.38,173,542 ක් වූ ක්ෂය සංචිත අරමුදල් ගිණුමේ ශේෂය කෙටිකාලීනව චලනය නොවන වත්කමක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

### 2.2.2. ගිණුම් ඉදිරිපත් කිරීම සහ පවත්වාගෙන යාම

අරමුදලේ ගිණුම් කටයුතු වෙනුවෙන් පොදු ලෙජරයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ දුම්කොළ තැගි අරමුදලක් ස්ථාපිත කර දුම්කොළ බදු පනත යටතේ අය කරනු ලබන දඩ මුදලින් 1/4 ක් දුම්කොළ තැගි අරමුදලට මාරු කළ යුතු විය. එහෙත් දුම්කොළ තැගි අරමුදලක් ස්ථාපිත නොකර දුම්කොළ දඩ මුදල් ලැබීම්ද සුරාබදු තැගි අරමුදල යටතේ දක්වා තිබුණි. එසේම අදාල මුදල දුම්කොළ තැගි අරමුදලට ගෙවිය යුතු මුදලක් ලෙස සුරාබදු තැගි අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේද දක්වා තිබුණි.

## 2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු.75,164,200 ක් වූ ස්ථාවර වත්කම් සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකෙරුණු අතර අරමුදල සතුව පවතින බවට වාර්තාවී ඇති රු. 47,134,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන්ද ලේඛනගත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.32,263,375ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.79,009,718 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.46,746,343 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. සමථ ගාස්තු ලැබීම් ආදායම රු.45,895,124 කින් හෙවත් සියයට 25කින් අඩු වී තිබීම මෙම අතිරික්තය අඩු වීමට මූලිකව බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අරමුදල ඇති කිරීමේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය.

- ❖ සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් සහ වෙනත් අයට තෑගි මුදල් ගෙවීම.
- ❖ පුහුණු කිරීම් සහ අධ්‍යාපනික කර්තව්‍යන්ට මුදල් සැපයීම.
- ❖ වර්ෂයකට රු.50,000 ක සීමාවකට යටත්ව සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා, විනෝද සහ සුභ සාධක වැඩවලට මුදල් සැපයීම.
- ❖ සුරාබදු දෙපාර්තමේන්තුවට අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ සහ වෙනත් දෑ මිලදී ගැනීම.
- ❖ ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීමක් කළ යුතු වෙනත් ක්‍රියාවලට තෑගි මුදල් ගෙවීම.
- ❖ විශේෂ රාජකාරීන් හෝ විශේෂ වැටලීම් සඳහා ක්ෂේත්‍රයට වැටලීම් පිරිස් යැවීමේ දී දෙපාර්තමේන්තුවට දරන්නට සිදුවිය හැකි වියදම් පියවීම.

මෙම අරමුණු ඉටුකිරීම සම්බන්ධව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අරමුදලට ලැබෙන ප්‍රධාන ලැබීම් වන සමථ ගාස්තු සහ සිගරැට් දඩ ආදායම පසුගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| ලැබීම් | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| සමථ ගාස්තු | 133,500,640 | 178,507,964 |
| සිගරැට් දඩ | 3,453,950 | 4,341,750 |
| එකතුව | 136,954,590 | 182,849,714 |

2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්මික අපරාධ ආදායම රු.45,007,324 කින් හෙවත් සියයට 25 කින් අඩුවී තිබුණු අතර, සිගරැට් දඩ ආදායමද රු. 887,800 කින් හෙවත් සියයට 20 කින් අඩු වී තිබුණි. සුරාබදු නිලධාරීන්ගේ කැපවීම මත කාර්මික අපරාධ අඩුවීම සමථ ගාස්තු ආදායම අඩු වීමට හේතු වී ඇති බව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් විගණනයට වාර්තා කර තිබුණද, නිලධාරීන් විසින් ඉකුත් වර්ෂ වලදී සිදුකර ඇති සුරාබදු වැටලීම් ප්‍රමාණයන්ගේ අඩු වීමද ආදායම අඩු වීම සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) නිලධාරීන්ගේ පුහුණු හා අධ්‍යයන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.4,500,000 ක් වෙන් කර තිබුණද පුහුණුව ලැබූ නවක නිලධාරීන්ට ආහාර සැපයීම වෙනුවෙන් පමණක් ඉන් රු.2,331,515 ක් හෙවත් සියයට 52 ක් වැය කර තිබුණි. එසේම ඉතිරිය වූ රු.2,168,**485** ක මුදල කිසිදු පුහුණු කටයුත්තක් සඳහා වැය කර නොතිබුණි. ඒ අනුව ආයතනයේ නිලධාරීන්ගේ පුහුණු සහ අධ්‍යයන කටයුතු සඳහා විධිමත් සැලැස්මක් සකස් කර ප්‍රතිපාදන අනුමත කර ගැනීමක් සිදුකර ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවිය.

(ඇ) අරමුදලේ අරමුණු වන ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් යනාදී කටයුතුවලට ගෙවීම සඳහා රු.200,000 ක මුදලක්ද, ක්‍රීඩා විනෝද සහ සුභ සාධන කටයුතුවලට ගෙවීම සඳහා රු.50,000 ක මුදලක්ද වෙන්කර තිබූ අතර මෙම වෙන් කිරීම් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. ඒ අනුව අරමුදලේ අරමුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඈ) සුරාබදු කාර්මික අපරාධ වැටලීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තා අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2014, 2015 සහ 2016 වර්ෂයන්හිදී සිදුකර ඇති වැටලීම්වල අඩුවීම පිළිවෙලින් 1101 ක් , 387 ක් හා 339 ක් විය. සමාලෝචිත වර්ෂයේදී නවක සුරාබදු පරීක්ෂකවරු 48 දෙනෙකු බඳවා ගෙන තිබුණද කාර්මික වැටලීම් සංඛ්‍යාවේ වර්ධනයක් නිරීක්ෂණය නොවීය.

(ඉ) දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති විශේෂ මෙහෙයුම් ඒකකයන් සහ සුරාබදු කාර්යාලයන් සඳහාත්, මත්ද්‍රව්‍ය නාශක අංශය සඳහාත් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 355 ක් අනුයුක්ත කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවලට අනුව එම කාර්යාලවල කාර්මික අපරාධ සම්බන්ධව ඉලක්කගත වැටලීම් හා තථ්‍ය වැටලීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මධ්‍යස්ථානය** | නිලධාරීන් සංඛ්‍යාව (සු.පරීක්ෂක, සු.නියාමක) | ඉලක්කගත වැටලීම් 2016.12.31 දිනට | තත්‍ය වැටලීම් 2016.12.31 දිනට |
|---|---|---|---|
| විශේෂ මෙහෙයුම් ඒකකය - මධ්‍යම | 10 | - | 57 |
| විශේෂ මෙහෙයුම් ඒකකය - වයඹ | 14 | 100 | 108 |
| විශේෂ මෙහෙයුම් ඒකකය - දකුණ | 05 | - | 17 |
| විශේෂ මෙහෙයුම් ඒකකය - උතුරු මැද | 10 | - | 19 |
| විශේෂ මෙහෙයුම් ඒකකය - කොළඹ | 19 | - | 209 |
| ප්‍රාදේශීය කාර්යාල | 281 | 3513 | 4183 |
| | 339 | 3613 | 4593 |

ඉහත සටහන අනුව වයඹ පලාත සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා ඉලක්කගත වැටලීම් 3613 ක් ලබා දී තිබුණද මධ්‍යම, දකුණ, උතුරු මැද යන පලාත් වල පිහිටුවා ඇති විශේෂ මෙහෙයුම් ඒකක සඳහා ඉලක්කගත සංඛ්‍යා ලබා දී නොතිබුණි. එසේම කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති විශේෂ මෙහෙයුම් ඒකකය සඳහාද ඉලක්කගත සංඛ්‍යා ලබා දී නොතිබුණ අතර එසේ ඉලක්කගත සංඛ්‍යා ලබා නොදීමට බලපෑ හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය අනුව පිහිටුවනු ලැබූ "සුරාබදු තෑගී" අරමුදලින් සුරාබදු නිලධාරීන්ට මෙන්ම, තොරතුරු සපයන්නන්ටද සහ වෙනත් පාර්ශවයන්ටද, තෑගි ගෙවීම් සඳහා වූ අනුමත ලිඛිත ක්‍රමවේදයක් 2016 දෙසැම්බර් 31 දිනටද අරමුදල විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) පහත සඳහන් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(i) සමථ ගාස්තු සම්බන්ධයෙන් තෑගි මුදල් ගෙවීමට අදාල තොරතුරු ප්‍රාදේශීය කාර්යාලවල හැරුණු විට ප්‍රධාන කාර්යාලයේ වාර්තාගත කිරීමක් සිදුකර නොතිබීම.

(ii) ඉදිරියේදී පසුගිය කාර්මික අපරාධ වාර්තා කොපමණ ප්‍රමාණයක් සඳහා ගෙවීම් කළ යුතුද යන්න තොරතුරු පවත්වා නොගැනීම.

(iii) අපරාධ අංශය හා මුදල් අංශය සම්බන්ධීකරණය වී කටයුතු නොකිරීම.

(iv) කාර්මික අපරාධ වාර්තා සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නොකිරීම.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අරමුදලින් මිලදී ගෙන තිබූ රු.77,690 ක් වූ පුස්තකාල පොත් තොගයක් වසර 04 කට ආසන්න කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සුරාබදු තෑගි අරමුදලට අදාලව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

වැය විෂයයන් 6 කට අදාල අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා අතර සියයට 37 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | විධිමත් පරිදි ලෙජර් ගිණුම් පවත්වා නොගැනීම. |
| (ආ) | වත්කම් පාලනය | ක්‍රමවත්ව ලේඛන පවත්වා නොගැනීම සහ සත්‍යාපනය සිදු නොකිරීම. |